# Transforming Communities for Inclusion- Asia Pacific

**ආසියා පැසිපික් කලාපයේ රටවල් 21 ක මනෝ සමාජයීය ආබාධ සහිත පුද්ගලයින් හා අන්තර් ආබාධිතතා හිතවාදීන් නියෝජනය කරන අපි, 2018 අගෝස්තු 29 වැනි දින ඉන්දුනීසියාවේ බාලි හී පැවැති ටී. සී. අයි. ආසියා[1] සංවිධානයේ සැසිවාර රැස්වීමේ දී මෙසේ තහවුරු කරන්නෙමු:**

- වෙන් කොට සැලකීම, බැහැර කිරීම, ප්‍රචණ්ඩත්වය, අමානුෂීය, බේදජනක හා හිංසන ක්‍රියා ඇතුලු ක්‍රමානුකූල ව හා ව්‍යාප්ත ව පවතින අපගේ සියලුම මානව හිමිකම් කඩකිරීමේ අවස්ථා, ඉහළ හා පහළ ආදායම් ලබන රටවල ද, නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල ද, දුරස්ථ දූපත්වල ද, ආයතන සහ ප්‍රජාවන් තුළ ද, පාසල්, විශ්ව විද්‍යාල, සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන මෙන් ම සමාජ සේවාවන් හී ද පවතී.
- කාලීන හා නව ප්‍රතිපත්තිම ය ප්‍රතිචාරවල අසාර්ථකත්වයට හේතු වන්නේ: නිදහස, ඡන්දය (තෝරා ගැනීම) හා අවස්ථා සීමා කෙරෙන වෛද්‍ය ආකෘතියට සීමා වූ, මානසික සෞඛ්‍ය පද්ධතියේ අධීක්ෂණයෙන් යුතු පාලනය හරහා තක්සේරු කිරීම, තත්වාරෝපණය, පාලනය, සහ අපේ අයිතීන් ලබා ගැනීම සීමා කිරීම සහ පූර්ණ අන්තර්කරණයක් සඳහා වූ තෝරා ගැනීම් හා අවස්ථා වැඩි කළ හැකි, ප්‍රජාවන් තුළ, විවිධ සංස්කෘතීන් හා ආගමික පරිසර තුළ අන්තර්කරණය සඳහා ඇති සම්පත් බොහෝ අවස්ථාවල දී නොසළකා හැරීම යි.
- මෙම ප්‍රතිපත්තිම ය ප්‍රතිචාර බොහෝ විට මානසික සෞඛ්‍යය මත කේන්ද්‍ර ගත වන අතර ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට සහ විවිධ ජාත්‍යන්තර සම්මුතීන් හ ප්‍රකාශනවල රාමුවලට, ප්‍රධාන වශයෙන් ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට අනුකූල නොවේ.

ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුව, *සියලු ආබාධ සහිත පුද්ගලයින්* අන්තර්කරණය සඳහා වූ ප්‍රතිපත්ති හා නීති පද්ධතිය තුළ මනෝ සමාජයීය ආබාධ සහිත පුද්ගලයින් අන්තර්කරණය සම්බන්ධයෙන් කලාපයේ සමහර රටවල ප්‍රගතිය ඔස්සේ පෙළඹවීමෙන්, 'වෛද්‍ය ආකෘතිය'' හෝ ''මානසික සෞඛ්‍යය'' පමණක් අවධාරණය කිරීමෙන් බැහැර ව, ''අන්තර්කරණය'' සඳහා නැඹුරුතාවකින් යුතු සුසමාදර්ශ විචල්‍යතාවක් සනාථ කිරීමට,

වඩාත් ඉදිරියෙන් සිටින/ ප්‍රගතිශීලී මානසික සෞඛ්‍ය පරිසර තුළ ද, අධ්‍යාපනය, රක්ෂාව, පවුල, සමාජ ආරක්ෂණය, ආහාර, මූලික අවශ්‍යතා සහ ප්‍රමාණවත් ජීවන තත්වයක්, ඡන්දය ප්‍රකාශ කිරීම, ජීවිතය සහ නිදහස, නීතිය සමාන ව පිළිගැනීම, යනා දී වූ මානව හිමිකම් යටතේ පිළිගැනෙන සියලු අයිතීන් ද ඇතුළත් ව, අපේ අයිතිවාසිකම් පාලනය හෝ ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රමාණය සම්බන්ධයෙන් තැති ගැනුණු අපි,

---

[1] ටී. සී. අයි. ආසියා පැසිපික් යනු ආසියා පැසිපික් කලාපයේ රටවල් 21 ක මනෝ සමාජයීය ආබාධ සහිත පුද්ගලයින් හා අන්තර් ආබාධිතතා හිතවාදීන්ගේ සංධානයකි. ටී. සී. අයි. ආසියා පැසිපික් සංවිධානයේ දැක්ම වන්නේ මනෝ සමාජයීය ආබාධ සහිත සියලුම පුද්ගලයින් සඳහා ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය ක්‍රියාත්මක කිරීමයි. මෙහි දී, ටී. සී. අයි. ආසියා පැසිපික් සංධානයේ අවධානය යොමු වන්නේ ස්වාධීන ව ජීවත්වීම හා ප්‍රජාව තුළ දිවි ගෙවීම සඳහා මනෝ සාමාජයීය ආබාධ සහිත පුද්ගලයින්හට අවස්ථාව සලසාදීමට යි (19 වැනි වගන්තිය)

නොනවත් වා පවත්වාගෙන යන්නා වූ වෙන් කොට සැලකීම සම්බන්ධ ගැටලු අතර, **මනෝ සමාජයීය ආබාධ සහිත පුද්ගලයින් බැහැර කිරීම** බරපතල ගැටලුවක් ලෙස අවධාරණය කරමු.

- ආසියා පැසිපික් කලාපය තුළ නව මානසික සෞඛ්‍ය නීතිවල වර්ධනය තුළ ප්‍රධාන නියෝග යටතේ කැමැත්ත නොවිමසා රෝහල් ගත කිරීම සහ ප්‍රතිකාර කිරීම, මනෝ වෛද්‍ය රෝහල්වල නතරවීම් වැඩි වන අවකාශයකට මග විවර වීම්, මනෝසමාජයීය ආබාධ සහිත පුද්ගලයින් අත් විඳින කායික හා ලිංගික අපයෝජනය ඇතුලු මානසික ආයතනවල බිහිසුණු තත්වයන්, ආසාදන, නිරාහාරය, මන්දපෝෂණය, ඍජු කම්පන ප්‍රතිකාර (නිර්වින්දනයෙන් තොර ව), නියාමනයෙන් තොර හික්මවීම්, හුදකලාවේ රඳවා තැබීම්, සහ වෙනත් අමානුෂීය, ගෞරවය කෙලසන හා හිංසන ප්‍රතිකාර;
- පවුල හා ප්‍රජාව තුළ අයිතීන් උල්ලංඝනය වීම - බහුල වශයෙන් දක්නට ලැබෙන බැඳ තැබීම්, නෙරපා දැමීම සහ පවුලේ සහ ප්‍රජාවේ කිසිදු කටයුත්තකට සහභාගිවීමට අවස්ථා නොදීම, සමාජ සත්කාරක ආයතන, නියාමනය නොවන නිවාස, මුඩුක්ක හා සත්ව කූඩු තුළ සිදුවන හුදකලා කොට අමානුෂීය, ගෞරවය කෙලසන, කෲර හා හිංසන තත්වයන්;
- අබලතා නීතීන් යොදා ගනිමින් රාජ්‍ය අනුමැතියෙන් යුතු වෙනස් කොට සැළකීම හරහා මනෝ සමාජීයය ආබාධ සහිත පුද්ගලයින්ගේ හඬ පූර්ණ වශයෙන් නිහඬ කිරීම පොදු රාජ්‍ය මණ්ඩලය තුළ නිතර භාවිතා වේ. සංවර්ධනය තුළ අපගේ අන්තර්කරණයට එරෙහි වන පද්ධතිමය වෙනස් කොට සැළකීම, සුවිශේෂී වශයෙන් කාන්තාවන්, ළමයින්, සමලිංගිකයින්, ආදිවාසීන් සහ වෙනත් කණ්ඩායම් අප සමාජය තුළ බහුවිධ වශයෙන් වෙනස් කොට සැළකීමට ලක්වේ.

නෛතික, ප්‍රතිමානක හා සමාජ ව්‍යුහයන් තුළට කාවැදුනු, එමෙන් ම, අධිරාජ්‍යවාදී, ඓතිහාසික සම්ප්‍රදායයන් විසින් ශක්තිමත් කළ, මෙවන් උත්සුකතා ආසියා පැසිපික් කලාපය තුළ සෑම සියලු තන් හී කඩින් කඩ නොව, නිරන්තර ව සිදුවන බවට තහවුරු වී ඇති බවටත්,

එවන් නීති හා සම්ප්‍රදායයන් හරහා කෙරෙන උල්ලංඝනයන්, ''අපගේ උතුම් යහපත වෙනුවෙන්'' යන නාමය යටතේ මානව හිමිකම් ප්‍රතික්ෂේප කිරීම සාක්ෂාත් කරන මානසික සෞඛ්‍ය පද්ධතීන් ඉතා සුලු වශයෙන් වැඩි දියුණු කිරීමෙන්, ආමන්ත්‍රණය කළ නොහැකි ය. අපගේ මනාපය, අභිමතය, හා වැඩි කැමැත්තට අනුකූල වූ ද, අන්තර්කරණය සඳහා පරමාදර්ශී වූ ද, ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පිළිගැනීමෙන් පමණි යැ යි **සිහිපත් කරමින් ද,**

- අසමානතා අඩු කරමින් කිසිවකුත් අත් නොහැර, බලසතුකරණය මෙන් ම සියල්ලන්ගේ සමාජයීය, ආර්ථික හා දේශපාලනික අන්තර්කරණය ප්‍රවර්ධනය කරමින්, සියලු ම එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් විසින් තිරසාර සංවර්ධන පරමාර්ථ ක්‍රියාත්මක කිරීමට කැපවීම
- සියලු ම ආසියා පැසිපික් රාජ්‍යයන් විසින් 'Incheon උපායමාර්ගය' ක්‍රියාත්මක කිරීම හරහා සියලුම ආබාධ සහිත පුද්ගලයින් සඳහා ''අයිතිවාසිකම සැබෑවක් බවට පත්කිරීම''
- පැසිපික් රටවල් විසින් අබාධ සහිත පුද්ගලයින්ගේ අයිතීන් පිළිබඳ පැසිපික් රාමුව සඳහා කැපවීම

තිරසාර සංවර්ධන පරමාර්ථ අන්තර්කරණයෙන් යුතු ව ක්‍රියාවට නැංවීම සහ මානව හිමිකම් පූර්ණ වශයෙන් සාක්ෂාත්කරණය අන්‍යොන්‍ය වශයෙන් එකිනෙක ශක්තිමත් කරන බව **පිළිගනිමින් ද,**

- මේ දක්වා ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය හා සම්බන්ධ ආසියා පැසිපික් කමිටුවේ සමාප්ති නිරීක්ෂණ හා නිර්දේශ මෙන් ම, වගන්තිය 12 - නීතිය ඉදිරියේ සමාන ව පිළිගැනීම[2], වගන්තිය 6 - ආබාධ සහිත කාන්තාවන්[3], වගන්තිය 19 - ස්වාධීන ව ජීවත්වීම සහ ප්‍රජාව තුළ දිවි ගෙවීම සඳහා අවස්ථාව සලසාදීම[4], වගන්තිය 5 - අන් අය අතර සමානාත්මතාවය හා වෙනස් කොට නොසැළකීම[5] යන වගන්තීන් ට අදාළ සාමාන්‍ය ප්‍රකාශයන්,

[2] CRPD /C/GC/1, (2014) CRPD General Comment 1 on Right to Equal Recognition before the Law.
[3] CRPD/C/GC/3 (2016) General Comment on Women with disabilities.
[4] CRPD/C/GC/5 (2017) General Comment on Right to Living independently and being included in community.
[5] CRPD/C/GC/6 (2018) General Comment on Equality and Non - Discrimination.

- සමාජ ආරක්ෂණය[6], අන්තර්කරණ ප්‍රතිපත්තිය[7], නෛතික ධාරිතාව[8] සහ සහභාගිත්වය හා ආබාධ සහිත පුද්ගලයින් සඳහා අයිතිවාසිකම් පාදක සහාය[9] පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය වෙත, ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු විසින් ඉදිරිපත් කළ වාර්තා,
- මානසික සෞඛ්‍යය, ලෝ වටා මානසික සෞඛ්‍ය පද්ධතීන් තුළ ඇති ''දූෂණය'' පිළිබඳ ප්‍රකාශනය[10] හා මනෝ සමාජයීය ආබාධ සහිත පුද්ගලයින් මුහුණ දෙන ''ගෝලීය බාධක භාරය'' සම්බන්ධ හෙලා දැකීම[11] පිළිබඳ මානව හිමිකම් කවුසිලය වෙත ඉහළම ප්‍රමිතියෙන් යුතු කායික හා මානසික සෞඛ්‍යය සඳහා අයිතිය පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව,
- සෞඛ්‍යයට ආදාළ සමාජයීය, ආර්ථික හා පාරිසරික නිර්ණායකයන්, සෑම පුද්ගලයකුගේ ම අයිතිවාසිකම්, අභිමතය හා වැඩි කැමැත්තට ගෞරව කිරීමට අපොහොසත් වන සියලු සම්ප්‍රදායයන් අත්හැර දැමීම, ආයතනිහරණය, පමණට වඩා වෛද්‍යකරණය වළක්වාලීම, සහ පුද්ගලයකුගේ නිදහස සහ සුරක්ෂාව භුක්ති විඳීමේ අයිතිය  හා ප්‍රජාව තුළ අන්තර්කරණය සඳහා ආමන්ත්‍රණයට ආරාධනා කරමින් ද ඉදිරිපත් කළ මානසික සෞඛ්‍යය හා මානව හිමිකම් පිළිබඳ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව[12], (2017) ද පිළිගනිමු.

ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙ හි අන්තර්ගත සියලුම මානව හිමිකම් පූර්ණ වශයෙන් සාක්ෂාත් කර ගැනීම සහ විශේෂයෙන් ම ස්වාධීන ව ජීවත්වීමට හා ප්‍රජාව තුළ දිවි ගෙවීම සඳහා අවස්ථාව සලසාදීම (19 වගන්තිය, 5 ජේදය) සම්බන්ධයෙන් අපට අවශ්‍ය වන්නේ, 1) අපගේ පදිංචි ස්ථානය හා අප ජීවත් වන්නේ කා සමග ද යන වග තීරණය කිරීමට, 2) අප පදිංචි ස්ථානයට ආසන්නයේ පවතින ගෘහ මට්ටමේ, නේවාසික සහ/හෝ ප්‍රජා මට්ටමේ සහායක සේවාවන් පරාසයකට ප්‍රවේශය, 3) පවතින සියලු සේවාවන් සඳහා අන් අය සමග සමාන පදනමකින් යුතු අන්තර්කරණය, 4) සියලුම සේවාවන් අපගේ සුවිශේෂී අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්විය යුතුය.

**ක්‍රියාත්මක වීමට ආරාධනා**

මනෝ සමාජයීය ආබාධ සහිත පුද්ගලයින් අන්තර්කරණය උදෙසා පරමාදර්ශී මාරුවක්: වෛද්‍යමය ආකෘතියේ සිට සමාජ ආකෘතිය වෙත, මානසික රෝග සිට මනෝ සමාජයීය ආබාධ වෙත, මහජන සෞඛ්‍යයේ සිට අන්තර්කරණ සංවර්ධනය වෙත, ආයතනීකරණයේ සිට අන්තර්කරණය වෙත, ප්‍රතිකාර සිට සහායක සේවා වෙත, ගෙන යන ප්‍රතිපත්ති පරිසරයක් ප්‍රතිනිර්මාණයකිරීමට පාලමක් ලෙස ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සහ තිරසාර සංවර්ධන පරමාර්ථ විසින් මෙහෙය විය හැකි බැව් පිළිගනිමින්,

- එමගින්, මනෝ සමාජයීය ආබාධ සහිත පුද්ගලයින් අන්තර්කරණය යන්න සෞඛ්‍ය ක්ෂේත්‍රයට සීමා නොවී සියලු ම ක්ෂේත්‍රයන් තුළ සංවර්ධන න්‍යාය පත්‍ර, සැලසුම්, වැඩසටහන් සහ වෙනසක් සඳහා වූ සහයෝගීතාවන් හි සියලුම ක්‍රියාකාරීන්ගේ සහභාගිත්වයෙන් යුතු ව,  සමාජයීය, නෛතික, ප්‍රතිපත්තිමය සහ සේවාවන්ට අදාළ සියලුම ක්‍රියාකාරකම් හි  අරමුණ, ක්‍රියාවලිය සහ ප්‍රතිඵල තුළ අන්තර්ගත විය යුතුය.
- ''මානුෂීය'' මානසික සෞඛ්‍ය සත්කාරක සේවා අරමුණු කර ගනිමින් ප්‍රතිනිර්මාණය හා ප්‍රතිව්‍යුහකරණය සඳහා මෑත කාලීන ව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් කළ හානිය අඩු කිරීමේ ප්‍රවේශයන්ගෙන් ඔබ්බට යමින්, සහ  අඛණ්ඩ ව ගෙන යන ''ප්‍රතිව්‍යුහකරණ'' උත්සාහයයන් විසින් පද්ධතික දෝෂ සහිත, මනෝවෛද්‍ය ම ය රැඳවා තබා ගැනීම් සහිත පැරැණි අධිරාජ්‍යවාදී  ආකෘතීන් පවත්වා ගෙන යතැ යි යන සැකය ද ප්‍රකාශ කරන අතර, ලෝක සෞඛ්‍ය සංවිධානයේ ''ගුණාත්මක අයිතීන්'' යනු අන්තර්කරණය සම්බන්ධයෙන් ඇති අපේ ගැටලුවට විසඳුමක් යැ යි සාවද්‍ය ලෙස සළකා බැලීමට ඉඩ ඇතැ යි අවධාරණය කරමු.
- අවිහිංසාවාදී, සමානකයින්ගේ නායකත්වයෙන් යුතු, ක්ෂතිය පිළිබඳ දැනුවත්, ප්‍රජා නායකත්වයෙන් යුතු වැඩසටහන්, සමනය, මනෝ සමාජයීය ආබාධ සහිත පුද්ගලයින්ගේ ප්‍රාදේශීය කණ්ඩායම් වැඩි කැමැත්තක්

---

[6] A/70/797
[7] A/71/314
[8] A/HRC/37/56
[9] A/HRC/34/55
[10] A/72/137
[11]A/HRC/35/21
[12] A/HRC/34/32

දක්වන සංස්කෘතික සම්ප්‍රදායයන්, ජාත්‍යන්තර ව හා ආසියා-පැසිපික් කලාපය තුළ වෛද්‍යම ය නොවන විකල්පයන් සොයන ව්‍යාපාරයන්, සහ ප්‍රජා සහායක ප්‍රගතිශීලි ආකෘතීන් අනුගත කර ගැනීම

මනෝ සමාජයීය ආබාධ සහිත පුද්ගලයින් සෑම පියවරක දී ම නියැළෙන බවට සැළකිලිමත් වෙමින් පහත ක්‍රියාමාර්ග අපි ඉදිරිපත් කරන්නෙමු:

- **අධ්‍යාපනය සඳහා ඇති අයිතිය:** දිවිය පුරා ඉගෙනුම උදෙසා, අධ්‍යාපන ක්‍රමය තුළ ප්‍රතිසංස්කරණ, වාචික නොවන/කලාව පදනම් කොට ගත් ප්‍රකාශන වැනි විකල්ප සහ වැඩිදියුණු කළ සන්නිවේදනය කෙරේ ප්‍රවේශය, නම්‍යශීලී වැඩසටහන් සහ විවිධ සහායක සේවාවන් සඳහා ප්‍රවේශය, සාධාරණ අවස්ථා, ඇති කළ යුතු අතර, අනතුරුදායක, බලහත්කාරී හෝ වුවමනාවට වඩා වෛද්‍ය ම ය වශයෙන් දරුවන් ආයතන ගත කිරීම් තහනම් කළ යුතුය;
- **වැඩ සහ රැකියා නියුක්තිය සඳහා ඇති අයිතිය:** රැකියා වෙළෙඳපොළ සහ රැකියා හුවමාරුවන් තුළ, රැකියා ස්ථාපනය සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා සහාය දැක්වීමේ දී මනෝසමාජයීය ආබාධ සහිත පුද්ගලයින් අන්තර්කරණය කිරීම, සහාය ලබාදීම, රැකියා ස්ථානවල නම්‍යශීලී වැඩ පැය සහ සාධාරණ ස්ථානයක් ලබාදීම, ආබාධිතතා සඳහා ඇති ප්‍රතිලාභ, අන් අය හා සමාන ව සැළකීම, දායකත්වය සඳහා සුදුසු පිළිගැනීම ලබාදීම, වෘත්තිම ය වශයෙන් සංවර්ධනය වීම සඳහා අවස්ථා, පුහුණු සහ උසස්වීම් සඳහා ප්‍රවේශය, අනෙකුත් සේවකයින්ට හා සමාන ව සිදු කළ යුතු ය.
- **ප්‍රමාණවත් ජීවන තත්වයන් හ සමාජයී ය සුරක්ෂිතභාවයක් සඳහා ඇති අයිතිය** තහවුරු කිරීම: සියලු සමාජ ආරක්ෂණ වැඩසටහන් තුළ මනෝසමාජයීය ආබාධ සහිත පුද්ගලයින් අන්තර්කරණයේ දී, **ආහාර සඳහා අයිතිය** සාක්ෂාත් කිරීම, විශේෂයෙන් ම ආසියා-පැසිපික් කලාපය තුළ රඳවා තබා ගෙන/ගැට ගසා සිටින පුද්ගලයින් ගලවා ගැනීමටත්, ආයතන ගත කිරීම වළකා ප්‍රජාව තුළ ජීවත්වීම සැලැස්වීමටත්, උපරිම වශයෙන් වැදගත් වන **නිවාස සඳහා අයිතිය** සුරක්ෂිත කිරීම, සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලවල් මගින් පුද්ගලයින්හට දිළිඳුකමෙන් ගැලවීමට හා දියුණුවීමට උදව් කිරීම, එවැනි වැඩපිළිවෙලවල්, මනෝසමාජයීය ආබාධ සහිත පුද්ගලයින්ගේ අභිමානය, ගෞරවය, ස්වාධිනත්වය සහ ස්වාධීන ව ජීවත්වීම සාක්ෂාත් වන සේ නිර්මාණය කිරීම
- **සෞඛ්‍ය සේවා සඳහා ඇති අයිතිය සුරක්ෂිත කිරීම:** අනෙකුත් පුද්ගලයින් හා සමානාත්මතාවෙන් යුතු විස්තීර්ණ සාමාන්‍ය සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය, උසස් මට්ටමේ සෞඛ්‍ය හා යහපැවැත්මක් ලබා ගැනීම සඳහා මනෝ වෛද්‍ය සේවා බාධාවක් නොවීම, වෛද්‍යවරුන්ගේ වාචික හෝ චිකිත්සාමය ක්‍රියාවන් හේතුකොට ගෙන ඇති වන සංකූලතා (උදා:̤, වෙනත් කායික/හෘද රෝග ඇතුලු සෞඛ්‍ය සංකුලතාවන්ට අමතර ව ඇතිවන සොම්බි තත්වයන්, ආක්‍රමණික ආතතිය, පාකින්සන්, සයිකෝෂියාව, සියදිවි හානි කර ගැනීමේ ප්‍රවණතා හා හැසිරීම් ආදීය), පිළිබඳ ව ආබාධ සහිත පුද්ගලයින් හා ඔවුන්ගේ පවුලේ අය විසින් කෙරෙන වාර්තාවන් පිලිගැනීම හා පියවර ගැනීම, සංස්කෘතික වශයෙන් සංවේදී වූ යෝගා, ආහාර චිකිත්සාව, තෛ ෂි, බි ගොනග්, භාවනා, උපදේශනය, කථා චිකිත්සාව, කලා චිකිත්සාව ඇතුලු විවිධ නිවාරණ හා යහපැවැත්ම හා බැඳුණා වූ චිකිත්සාවන් සෞඛ්‍ය සේවා තුළ ආවරණය කිරීම
- **ආයතන ගත කිරීම් නතර කිරීම** සඳහා වැඩසටහන් සැකසීම: පුද්ගලානුබද්ධ සහාය, ප්‍රජා මට්ටමේ සත්කාරක කව, සම කණ්ඩායම් සහාය, විධිමත් හා නොවිධිමත් සහායක ජාල, පවුල් බලසතුකරණය, ඇහුම්කන් දීමේ ස්ථාන, සුරක්ෂිත/නිශ්ශබ්ද කාමර, නිර්මාණශීලී ප්‍රකාශන සඳහා අවකාශයන්, විශේෂයෙන් ම අර්බුදය සම්බන්ධ ව පුද්ගලයින්ගේ සංජානනය ඇති කිරීම, මනෝ සමාජයීය ආබාධ සහිත පුද්ගලයයින්ගේ වුවමනාව සහ අභිරුචිය පදනම් කොට ගෙන ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සාකච්ඡා කොට තීරණ ගැනීමට උදව් කිරීමේ පුහුණුව ලද පුද්ගලයින්, සහායක සේවාවන් විශේෂයෙන් ම නිවසක් නැති පුද්ගලයින්ට අදාළ ව, ඔවුන් ජීවත්වන ප්‍රජාව ආසන්නයේ මෙන් ම ශාන්ත, සාමකාමී හා ආරක්ෂිත පරිසරයක් පිහිටා තිබීම
- **දේශපාලන ම ය සහභාගිත්වයට ඇති අයිතිය,** (විශේෂයෙන් ම ඡන්දය දැමීමේ අයිතිය, ඡන්දයට ඉදිරිපත්වීමේ අයිතිය සහ නියෝජිතයකු ලෙස තේරිපත් වීමට ඇති අයිතිය) කලාපයේ සියලුම රටවල සුරක්ෂිත කිරීම

**අපගේ නිර්දේශ:**

**නීතිය ඉදිරියේ පූර්ණ හා සමාන පිලිගැනීම සඳහා ඇති අපේ අයිතිය** කලාපයේ සියලුම රටවල් විසින් පිලිගැනීමට කටයුතු කළ යුතුය. එමගින්, නීතිය අබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුකූල වීමෙන් මනෝසමාජයීය ආබාධ සහිත කිසිදු පුද්ගලයකුගේ සිවිල්, සමාජයීය, දේශපාලන ම ය, ආර්ථික හෝ සංස්කෘතික අයිතීන්, ''නොහැකියාව'' හෝ ''විකල් මනස'' පදනම් කොට ගෙන කිසිවිටෙකත් උල්ලංඝනය නොවනු ඇත. විශේෂයෙන් ම, පොදු රාජ්‍ය මණ්ඩලය තුළ නීති පද්ධතින් තුළ ඇති අධිරාජ්‍යවාදී උරුමයන් ශෝධනය වුනු ඇත.

තාක්ෂණික, ආචාර ධර්ම හා සබැඳි, හා වෙනත් මාර්ගෝපදේශ, ප්‍රතිපත්ති, නීති සහ අපගේ අන්තර්කරණය සඳහා වන වෙනයම් ප්‍රයත්නයන් ඇතුලු සියලු ම ක්‍රියාවලින් හරහා ''අප පිළිබඳ කිසිත් අප නැති ව නොකරනු'' (Nothing about us without us) යන ප්‍රකාශය සාක්ෂාත් කිරීමට කටයුතු කළ යුතුය.

ලෝක සෞඛ්‍ය සංවිධානය ඇතුලු සියලු ම එක්සත් ජාතීන්, හා සමාන ආයතන ද, ආධාර දෙන ආයතන ද අපේ කලාපයේ සංවර්ධනය උදෙසා කෙරෙන රාජ්‍ය මට්ටමේ ගෝලීය වැඩසටහන් ද විසින් අන්තර්කරණ සංවර්ධනය සම්බන්ධ සියලු ම සහයෝගිතාවන්වල දී අපගේ සහභාගිත්වය හා අන්තර්කරණය අවධානයට ගත යුතුය. එවැනි ක්‍රියාවන් මානසික සෞඛ්‍යයේ සිට අන්තර්කරණය කරා යන පරමාදර්ශී වෙනසක් ඇති කිරීමට සැලකිලිමත් වනු ඇත.

**අපගේ අපේක්ෂිත ඉලක්ක**

- අපගේ අභිරුචියට අනුව, අපගේ අන්තර්කරණය උදෙසා කෙරෙන සියලුම ප්‍රගතිශීලී ක්‍රියාවන්ගේ ව්‍යාප්තිය අනුව, එම ක්‍රියාවන් සඳහා පුහුණු, ධාරිතා වර්ධනය, අන්තර්කරණය සඳහා මාර්ගෝපදේශ, අධ්‍යයන සහ අන්තර්කරණය උදෙසා නීතිමය සහ ප්‍රතිපත්තිම ය පරිසරය වෙනස් කරන සහයෝගීතාවන් හරහා දායක වීම.
- නායකත්ව මූලධර්මවලට මෙන් ම මනෝසමාජයීය ආබාධ සහිත පුද්ගලයින්ගේ පූර්ණ සහ ඵලදායී සහභාගිත්වයට ද අපගේ ජීවිතවලට හා අයිතීන්ට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් අපගේ ප්‍රවීණත්වය ගරු කරන, අපගේ පරමාර්ථ හා සැසඳෙන පරමාර්ථ ඇති සංවිධාන සමග එක් ව කටයුතු කිරීම.
- වේතන සහිත වැඩ. සමාජ සාධාරණය පිළිබඳ කටයුතු, නිර්මාණශීලී කටයුත, අව්ධිමත් සත්කාරක සහ සහායක සේවා හරහා අප සමාජයන් තුළ අර්ථවත් ස්ථානයක් ලබා ගැනීමට අපි කැමැත්තෙමු. විවිධත්වයෙන් යුතු අපගේ මානව විභවය පූර්ණ වශයෙන් සංවර්ධනය කිරීමට කටයුතු කරන්නා වූ පරිසරයක් ඇති කල අපගේ සමාජයන් තුළ සමාජයීය, ආර්ථික, සංස්කෘතික හා දේශපාලන ම ය උන්නතිය තවදුරටත් සාක්ෂාත් වන බව අපි විශ්වාස කරන්නෙමු.

**ටී. සී. අයි. ආසියා පැසිපික් සංවිධානය විසින් සම්මත කළ ප්‍රකාශනය**
**5 වැනි සම්භාව්‍ය සංශෝධන සැසිය**
**බාලි, ඉන්දුනීසියාව**
**2018 අගෝස්තු 29 වැනි දින.**

**කැඳවුම්කරු:**
Bapu Trust for Research on Mind & Discourse,
704 Fillicium, Nyati Estate, Mohammedwadi, Pune 411060 India
Email: tciasia.secretariat@gmail.com Web:https://tci-asia.org